57341

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2026
Year End Evaluation

ශ්‍රේණිය / தரம் / Grade	විෂයය / பாடம் / Subject	පත්‍රය / வினாத்தாள் / Paper	කාලය / காலம் / Time
10	සිංහල භාෂාව හා සාහිත්‍යය	I	පැය 01

නම/විභාග අංකය:.....

සැලකිය යුතුයි

- සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන උත්තරය තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
- එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

- අංක 01 සිට 04 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

(01) **තම මුදල් පසුම්බිය නැති බව දැනගත් විට ඔහුට දෙවියන් සිහිවිය.**

1. කලබලයට පත් විය
2. බොහෝ සේ බිය විය
3. ලැජ්ජාවට පත් විය
4. බොහෝ වේදනාවට පත් විය

(02) **වැඩිහිටියන් ඉදිරියේ ඔවුන්ගේ ඉහ නිකට බලා කතා කළ යුතු බව අම්මා කීවාය.**

1. ගෞරවාන්විතව
2. ඉතා සැලකිල්ලෙන්
3. තනතුරට ගැළපෙන ලෙස
4. වයසට ගැළපෙන ලෙස

(03) **එහිදී 'ඔහු ලැබූ සත්කාර ඉහටත් උඩින්' යැයි පැවසීය.**

1. බොහෝ ප්‍රමාණයක්
2. හිසටත් වඩා උසින්
3. සිතුවාටත් වඩා
4. අප්‍රමාණ

(04) **සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා ලබා දුන් නිදහස් අධ්‍යාපනය නිසා දරුවන්ට ස්වර්ණමය අවස්ථා හිමි වී ඇත.**

1. වාසනාවන්ත
2. කාලෝචිත
3. ඉතා වටිනා
4. රනින් කළ

- අංක 05 සිට 06 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැනට සුදුසු පදය තෝරන්න.

(05) විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ගේ ..... නිබන්ධන පිළිබඳ එහිදී විශේෂයෙන් සාකච්ඡා විය.

1. ගවේෂණ
2. පරීක්ෂණ
3. විශ්ලේෂණ
4. පර්යේෂණ

(06) සම්භාව්‍ය සාහිත්‍ය කෘති ලියා ඇති ..... රචනා ශෛලිය පාඨක රුචිය ඇද ගැනීමට සමත් වේ.

1. ප්‍රශස්ත
2. ප්‍රයුක්ත
3. ප්‍රවිෂ්ට
4. ප්‍රවීණ

Past Papers Wiki

(07) අකාරාදි පිළිවෙළ නිවැරදිව යෙදී ඇති පද පෙළිය තෝරන්න.

1. චමිල්, චරණ, චතුමි, චමෝද
2. මිගාර, මිහිල, මේනුක, මේනුජ
3. නිඝාන්ත, නිමන්ත, නිර්මල, නිමල්ක
4. මනුජ, තෙනුර, තුෂාර, පමිදු

(08) සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පෙළිය තෝරන්න.

1. විද්‍යමාන, යුහුසුළු, උද්හිද, සම්බන්ද
2. උද්ඝෝෂණය, අභිවෘද්ධිය, වලාකුල, ප්‍රසංශාව
3. අභිමතාර්ථය, විචක්ෂණය, ප්‍රවර්ධනය, සන්දර්භය
4. ජනඝණය, නිෂ්ඨාව, ප්‍රස්ථාවනාව, නිෂ්ප්‍රභ

(09) එක් එක් වචනවල මුලකුරෙහි දීර්ඝ පාපිල්ල, දීර්ඝ ඇදපිල්ල, ගැටය සහිත ඇලපිල්ල, ගයනුකිත්ත පිළිවෙළින් යෙදී ඇති වචන සහිත පද පෙළිය තෝරන්න.

1. මැණියෝ, ගෘහය, ඵෙක්‍ය, නෞකාව
2. රූස්ස, මෑකරල්, කෘමීන්, ගෞරවය
3. පූජාව, පැතිකඩ, නෘත්‍ය, සෞම්‍ය
4. සාමය, කුජනය, සීමාව, සෘතුව

(10) වර්ගාන්ත අක්ෂර පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

1. ච, ඡ, ජ, ඣ, ණ
2. ය, ර, ල, ව, ෆ
3. ත, ථ, ද, ධ, න
4. ඛ, ඤ, ණ, න, ම

(11) මුලින් දී ඇති පදයට සමාන අර්ථයක් නොදෙන පදයක් ඇතුළත් පද පෙළිය තෝරන්න.

1. හිරු - දිවයුරු, සතපා, දියනෙක, දිනිඳු
2. සුදු - ධවල, ඕදාත, ශ්වේත, ශුක්ල
3. පද්ම - පියුම, තඹර, ඉන්දීවර, සහස්පත
4. සයුර - සමුද්‍රය, දලනිඳු, අර්ණව, රුවනාර

(12) මුලින් දී ඇති පදයෙහි විරුද්ධාර්ථය නොදෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

1. ආරම්භය - නිමාව, සමාප්තිය, ප්‍රාරම්භය, අවසානය
2. අල්ප - අනල්ප, අප්‍රමාණ, නොමින්, අනූන
3. ධනවත් - දරිද්‍ර, නිවත්, නිදන, දිළිඳු
4. දුර - ළඟ, අසල, සමීප, නුදුරු

(13) මුලින් දී ඇති පදයෙහි බහු අර්ථ නිවැරදිව ප්‍රකාශ වන උත්තරය තෝරන්න.

1. දිය - ජලය, තෝ, උදක, පැන්
2. සතුට - දුක, දොම්නස, ශෝකය, කනගාටුව
3. නිරතුරු - නිබඳ, නිති, නිරන්තර, අනවරත
4. සර - නාදය, ශබ්දය, ඊතලය, පොකුණ

(14) එකම වර්ගයට අයත් නොවන යුගල පද පමණක් ඇතුළත් උත්තරය තෝරන්න.

1. සරු සාර, රෙදි පිළි, මං මාවත්, වස විස
2. දුගී මගී, වට්ටි පෙට්ටි, නීති රීති, ගේ දොර,
3. අඩල දුඩල, සිරිත් විරිත්, හෝන්දු මාන්දු, ඔප්පු තිරප්පු
4. වග තුග, මුදල් හදල්, ගණන් හිලවු, උදවු පදවු

(15) පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා පිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?

1. ගොස්, බලග, කියවත, සාදවයි
2. කියා, ආවොත්, අසා, විමසද්දී
3. දිනවයි, පැමිණෙනු, ඇතත්, ලියවයි
4. ගයද්දී, වසිත, කවයි, බලනු

- අංක 16 සිට 18 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදිව දැක්වෙන උත්තරය තෝරන්න.

(16) වර්තමානයේ ප්‍රවීණ ලේඛකයෝ පවතින සමාජ ගැටලු විවරණය කරමින් යථාර්ථවාදී කෙටි කතා ලියති.

1. සැබෑ අරුතින් යුත්
2. හැඟීම් දනවන
3. සත්‍ය ඉක්මවා ගිය
4. සියුම් විග්‍රහයක් ඇති

(17) සිංහල කලාශිල්පීන්ගේ කලා කෞශල්‍යය අවිනෂ්ට ව ඇති නිර්මාණවලින් හඳුනාගත හැකි ය.

1. විනාශයට පත් වූ
2. විනාශයට පත් නොවූ
3. සංකේතාත්මක ව ඇති
4. වෙන් කොට ආරක්ෂිතව ඇති

(18) කෝට්ටේ යුගයේ ලියන ලද සංදේශ කාව්‍යවලින් තත්කාලීන සමාජ තොරතුරු අනාවරණය වේ.

1. සෑම කාලයකට ම පොදු
2. අතීත කාලයට අයත්
3. එම කාලයට අයත්
4. වර්තමාන කාලයට අයත්

(19) සමානාර්ථවත් පද යුගල පමණක් ඇතුළත් උත්තරය තෝරන්න.

1. මහී - පොළව, හිරි - බිය, වාල් - වැලි, කෘෂ්ණ - සුදු
2. වෙර - සිරුර, සිදු - අශ්වයා, වේ - විදිය, පා - පය
3. දසන් - දර්ශන, පහන් - පැමිණි, රුවන් - රන්, අතුළ - විශාල
4. දූරීභූත - පුදුම, නල - සුළඟ, කලදෝ - ඊදී, වන් - වැනි

(20) 'කටුස්සා' යන පදයෙහි ප්‍රකෘතිය හා ප්‍රත්‍යය නිවැරදිව දැක්වෙන වරණය කුමක් ද?

1. කටුස් + සා
2. කටු + උස්සා
3. කටුසු + සා
4. කටුසු + ආ

(21) නාම විශේෂණයක් ඇතුළත් නොවන වාක්‍යය තෝරන්න.

1. උදැසන හිරු කිරණ වැටී නෙලුම් වනය විකසිත වේ.
2. ක්‍රීඩකයා වේගයෙන් පන්දුවට ගැසුවේ ය.
3. අවංක සේවකයෝ නීතියට ගරු කරති.
4. සුන්දර දිය ඇල්ල මනහරව පහළට ඇදෙයි.

(22) ක්‍රියා විශේෂණයක් ඇතුළත් වාක්‍යය තෝරන්න.

1. සිඹිති දැරියෝ වේදිකාවට පැමිණ ගී ගැයුවෝ ය.
2. මුව රංචුව වැව් පිටියෙහි සෙල්ලම් කරති.
3. පොහෝ දිනයේ දී චන්ද්‍රයා දීප්තිමත්ව බබළයි.
4. මද පවන වැදී තුරුලිය සෙලවේ.

(23) උපසර්ග පදයක් යෙදී නොමැති වචනයක් ඇතුළත් වරණය තෝරන්න.

1. දුර්ගුණ, සුනිමල, උදුල, ප්‍රණීත
2. අවබෝධය, පිරිපත, පිළිසරණ, ප්‍රතිකර්මය
3. අපවාද, නියෝග, අසරණ, අධිබල
4. අභිරහස, පියකරු, අනුවේදනීය, සම්මිශ්‍රණය

(24) ප්‍රථම පුරුෂ, සර්ව නාම පද පමණක් ඇතුළත් උත්තරය තෝරන්න.

1. ඇය, අපි, නුඹ, මා
2. ඔහු, හෙතෙම, ඕ, හේ
3. නුඹ, ඕ, හේ, ඔවුහු
4. ඔහු, ඇය, හෙතෙම, තා

(25) පුනරුදය, යසිසුරු යන පද අයත් සන්ධි වර්ගය වන්නේ,

1. පූර්ව රූප සන්ධිය, පූර්ව ස්වර ලෝප සන්ධිය
2. ස්වර සන්ධිය, ගාත්‍රාදේශ සන්ධිය
3. ආගම සන්ධිය, පූර්වස්වර ලෝප සන්ධිය
4. ආගම සන්ධිය, පූර්ව රූප සන්ධිය

(26) මුලින් දී ඇති පදවල නිවැරදි විසන්ධිය දක්වා ඇති වරණය තෝරන්න.

1. ක්‍රමෝපාය, ඒදිනෙදා - ක්‍රම + ඕපාය, ඒදින + එදා
2. ළිංතොට, දිවාහාර - ළිඳ + තොට, දිවා + ආහාර
3. දඬුවම්, අන්වීක්ෂ - දඬු + අම්, අනු + ඊක්ෂ
4. සිවුරඟ, පැහැති - සිවු + රඟ, පහ + ඇති

(27) A දෙමාපියෝ දරුවන් ..... රැස්වීමට පැමිණියෝ ය.
B අසරණ සතුන් ..... කරුණාව දැක්විය යුතු ය.
C ආරාධිත දේශනය ආරම්භ කළ ..... සිසුහු නිශ්ශබ්ද වූහ.
D ගායන තරගයේදී ආධුනිකයෝ ගීත දෙක ..... ගායනා කළෝ ය.
ඉහත වාක්‍යවල හිස් තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?

E - හෙයින් F - බැගින් G - කැටුව H - කෙරෙහි

1. E, H, G, F
2. G, H, E, F
3. G, H, F, E
4. H, G, E, F

(28) වැරදි අදහස දෙන වාක්‍යය තෝරන්න.

1. නිපාත හා උපසර්ග පද වර නැගිය හැකි ය.
2. අර්ධ ස්වර සමඟ අනුගත වන ස්වර ශබ්ද ඇත.
3. 'හ' අක්ෂරය ඝෝෂ ඌෂ්මාක්ෂර ගණයට අයත් වේ.
4. ඍ, ඎ මූර්ධජ අක්ෂර වේ.

- අංක 29, 30 යටතේ දී ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

(29) කෙනෙකුගේ යහපත් ගුණ මනාව ප්‍රදර්ශනය වීම

1. රන් රස සේ
2. කපන්න බැරි අත සිඹින්නා වගේ
3. කිරි මුහුදට සඳ පෑව්වා වගේ
4. කිරි කළයට ගොම බින්දුවක් දැමීමා වගේ

(30) නොගැළපෙන දෙදෙනෙකු එක කාර්යයක යෙදවීම
1. වක්කඩේ හකුරු හැංගුවා වගේ
2. කොහොඹ ගහට කරවිල වැල ගියා වගේ
3. නරියාට කුකුළු කොටුව බාර දුන්නා වගේ
4. එළහරකයි මී හරකයි ඇඳුවා වගේ

(31) අලළන, නරමුල්, ප්‍රාදුර්භූත, උවම් යන පදවල අදහස පිළිවෙළින් යෙදී ඇති වරණය තෝරන්න
1. අල්ලාගන්න, ඇටකටු, විනාශ වූ, මුහුණ
2. කලඹන, පැසුණු කෙස්, පහළ වූ, උපමා
3. පෙරළන, ගස්වල මුල්, බබළන, වුවමනා
4. සිඳ දමන, පරණ මුල්, ගැඹුරට ගිය, ශරීරය

- අංක 32, 33 යටතේ දී ඇති වාක්‍ය අතුරින් ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.

(32) 1. ඔහු නායකයෙක් මෙන් වගකීම් ඉටු කළේ ය.
2. අපි සත්‍යගරුක විය යුතු ය.
3. සියලු සාමාජිකයෝ රැස්වීමට පැමිණිය යුත්තෝ ය.
4. ක්‍රීඩකයන් තිදෙනෙකු රන් පදක්කම් ලබාගත්හ.

(33) 1. ගායකයන් විසින් ගී ගයනු ලබයි.
2. ඕ තොමෝ දැහැමිව කටයුතු කළෝ ය.
3. රියැදුරෝ මාර්ග නීති පිළිපදින්නේ කවදා ද?
4. දෙමාපියන් විසින් අප රකිනු ලැබුවේ ය.

(34) නිවැරදිව අර්ථය දී ඇති උත්තරය තෝරන්න.

i. අක්වැස්ස - පොදවැස්ස
ii. කුම්භකාර - මැටි කාර්මිකයා
iii. සේරංගාව - සෙවණ
iv. වඟා ඉස්සර - කුඹුර

1. i හා ii
2. ii හා iii
3. i හා iv
4. ii හා iv

(35) එකල්හි බුදුහු ඉදුහ බලයෙන් ඔවුන් පිළිබහා සඟුන් අතුරෙහි සිටවූහ.
මෙහි 'පිළිබහා' යන්නෙහි අර්ථය වන්නේ,

1. පස්සට කර
2. වළක්වා
3. පැත්තකට හරවා
4. ඉදිරියෙන් සිටුවා

(36) **'අකිකරු පුත්‍රයෙකුගේ ලෝකය, සක්වා ලිහිණි, සදා මෙලෙස පුර දෙරණේ'** යන සාහිත්‍ය නිර්මාණවල රචකයන් අනුපිළිවෙළින් ඇතුළත් උත්තරය තෝරන්න.

1. ඒ.වී. සුරවීර, පරාක්‍රම කොඩිතුවක්කු, මහගම සේකර
2. පරාක්‍රම කොඩිතුවක්කු, මහගම සේකර, ඒ.වී. සුරවීර
3. මහගම සේකර, ඒ.වී. සුරවීර, පරාක්‍රම කොඩිතුවක්කු
4. මොනිකා රුවන් පතිරණ, ඒ.වී. සුරවීර, සිරි ගුණසිංහ

(37) ඉතිහාස කතාවක් පාදක කොට ගෙන ලියන ලද නාට්‍යයක් වන්නේ,

1. මනමේ
2. ගුරු තරුව
3. සුබ සහ යස
4. තල මල පිපිලා

(38) රූපකයක් ඇතුළත් කාව්‍ය පාදය තෝරන්න.

1. ඉතිර වෙරළ දිව යන මෙන් රළ පතර
2. ලකළ ගුවන් තල සිරි යහන නිකසළ
3. පැහැදුල රිවි මඬල සකි පෙනෙය ත නෙතට
4. ඉසි වැනි නිමල් මලිගිය මල් සිය දිමුත

(39) පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයෙන් දැක්විය හැකි වඩාත් නිවැරදි ආකාරය තෝරන්න.
'අපි හැමෝම එකතු වෙලා මෙතැන සුද්ද කරන්න ඕනේ'

1. අපි සියලු දෙනා එක් වී මෙතැන පිරිසිදු කරමු.
2. අප සියලු දෙනා එකතු ව මෙතැන පවිත්‍ර කිරීම සුදුසුය.
3. අපි සියල්ලෝ ම එකතු වී මේ ස්ථානය ශුද්ධ කළ යුතුය.
4. අප සියලු දෙනා ම එක් වී මෙම ස්ථානය ශුද්ධ කළ යුතුය.

(40) මූලින් දී ඇති කොටසේ අර්ථය නිවැරදිව ඇති වාක්‍යය තෝරන්න.
'වර්තමාන ආර්ථික රටාව තුළ ජනතා ප්‍රශ්න රාශියකට විසඳුම් ලැබී ඇතත් අතුරු ප්‍රශ්න ගණනාවක් ද ඒ සමග ම උද්ගත වී ඇත.'

1. ජනතා ප්‍රශ්න විසඳීමට ගන්නා උත්සාහයේදී අතුරු ප්‍රශ්න ඇති වීමට ඉඩ නොතැබිය යුතුය.
2. පවත්නා ආර්ථික වැඩපිළිවෙළ මිනිසාගේ සියලු ප්‍රශ්න විසඳීමට සමත් වී ඇති බවක් නොපෙනේ.
3. ජනතාවගේ ප්‍රශ්න විසඳීමට නම් පවත්නා ආර්ථික ක්‍රමය වෙනසකට භාජනය කළ යුතුය.
4. වර්තමාන ආර්ථික රටාව නිසා ජනතාවගේ ඇතැම් ප්‍රශ්න නිරාකරණය වෙතත් අමතර ගැටලු ද මතු වේ.

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි
(முழுப் பதிப்புரிமையுடையது)
All Rights Reserved

57341

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2026
Year End Evaluation

ශ්‍රේණිය தரம் Grade	10	විෂයය பாடம் Subject	සිංහල භාෂාව හා සාහිත්‍යය	පත්‍රය வினாத்தாள் Paper	II	කාලය காலம் Time	පැය 02

සැලකිය යුතුයි

- සියලු ම ප්‍රශ්නවලට උත්තර ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත මුළු ලකුණු ගණන 80කි.

(01) අංක (i) සිට (x) තෙක් දී ඇති සියලු ම ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) (අ) විසර්ගය සහිත වචනයක් ලියන්න
(ආ) අක්ෂර මාලාවේ ඇතුළත් ඕෂ්ඨජ අක්ෂරයක් ලියන්න

(ii) පහත වාක්‍යයෙහි වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිවැරදි කර ලියන්න.
'පොත් පත් කියවා ලේකන ශෛලියෙහි හා ප්‍රකාශණ විලාසයෙහි විවිධතා හඳුනාගන්න.'

(iii) පහත සඳහන් උද්ධෘතවල ඉරි ඇඳි පද අයත් ක්‍රියා පද වර්ගය නම් කරන්න.
'මුළු ලොව උයනක් <u>කරවන්නී</u>'
'ඔබ <u>රැකුණොත්</u> ලෝ කුඹුව ද අප හට සීත ගඟුලි ලංකා'

(iv) පහත දැක්වෙන එක් එක් පදයට විරුද්ධාර්ථ පදය බැගින් ලියන්න.
(අ) උන්නතිය (ආ) සංකෝචනය

(v) පහත දී ඇති පද අයත් සන්ධි වර්ගය නම් කරන්න.
(අ) සන්නස (ආ) සුදුස්සෝ

(vi) වී ගොවිතැන හා බැඳුණු පහත දැක්වෙන විශේෂිත ව්‍යවහාර සඳහා පොදු ව්‍යවහාර පදය බැගින් ලියන්න.
(අ) උප්පිඩි (ආ) සේරංගාව

(vii) පහත දැක්වෙන අදහස්වලට ගැළපෙන තනි පද ලියන්න
(අ) යම් දෙයක වටිනාකම තීරණය කිරීම
(ආ) තම අභිමතයට අනුව වැඩ කරන

(viii) පහත සඳහන් උක්ත පදවලට ගැළපෙන අනුක්ත පද ලියන්න
(අ) හේ (ආ) කවුරු

(ix) පහත දී ඇති වාක්‍යයෙහි ඇතුළත් උපසර්ග පද දෙක තෝරා ලියන්න.
'ඇතැම් අනුවර්තන කෘති සම්පාදනය කිරීමේදී ලේඛකයෝ උසස් නිපුණතාවක් දක්වති.'

(x) පහත දැක්වෙන වාක්‍ය සදොස් නම් නිදොස් කොට ලියන්න.
(අ) සිංහලයන් අවදි කිරීමට අනගාරික ධර්මපාල උතුමාණෝ අප්‍රතිහත ධෛර්යයෙන් කටයුතු කර ඇත.
(ආ) අප විසින් මහමෙත් මහ තෙරණුවන් සැමරුණු

(ලකුණු 2 x 10 = 20යි)

(02) පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250කට නො අඩු වන සේ රචනාවක් ලියන්න. ඒ සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) නවීන තාක්ෂණික මෙවලම් භාවිතයෙන් පාසල් සිසුන්ට තම අධ්‍යාපන කටයුතු වඩාත් කාර්යක්ෂම ලෙස සිදු කළ හැකි ය. සිසුන්ට සාම්ප්‍රදායික සීමාවන්ගෙන් ඔබ්බට ගොස් නව දැනුම් සොයා යා හැකි ය. ඒ සඳහා තාක්ෂණය නිවැරදි ලෙස උපයෝගී කර ගත යුතු ය. එය ඉගෙනුම් ක්‍රියාවලිය ඉතාම පහසුවෙන්, නිවැරදිව හා උද්‍යෝගයෙන් කිරීමටත් ඉදිරි අනාගතය සවිමත් කර ගැනීමටත් මහඟු අත්වැලක් වනු ඇත.

(ආ) ක්‍රීඩාව නිරෝගී මිනිසෙකු බිහි කරන බව සමාජයේ ප්‍රකට, පිළිගත් මතයකි. වර්තමාන සමාජයේ කායික සුවතාව පිළිබඳ ගැටලු ඇති වීම හා බෝ නොවන රෝග වේගයෙන් පැතිරියාම ක්‍රීඩාවෙන් ඔබ්බට ගිලිහීම නිසා අද්දකින්නට ලැබෙන ව්‍යසනයකි. මානසික සහනය හා ආතතිය කළමනාකරණය කරගනිමින් මනස ප්‍රබෝධවත් කර ගැනීමට ක්‍රීඩාවේ නියැලීම මනා සේ උපකාරී වේ. විනයගරුකබව හා පෞරුෂය සකසා ගැනීමට ද සමාජීය සම්බන්ධතා වැඩිදියුණු කර ගැනීමට ද ක්‍රීඩාව මංපෙත් විවර කරයි.

(ඉ) මිනිසාට ජීවය දෙන පරිසරයට මිනිසා විසින් ම කරනු ලබන විවිධ අකටයුතුකම් නිසා අද වන විට ස්වභාවධර්මය මිනිසාට එරෙහි වීමේ ප්‍රවණතාවක් දැකගත හැකිය. එබැවින් ස්වාභාවික විපත් සහ ආපදා තත්ත්ව ගැන ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවලින් නිතර අසන්නට ලැබේ. මේ හේතුව නිසා ස්වාභාවික විපත්වලින් ජනතාව මුදවා ගැනීමටත් එමගින් දේපල හා ජීවිත රැකගැනීමටත් ක්‍රමෝපාය යෙදීම මිනිසාගේ පරම යුතුකම බව කිව යුතු ය.

(ඊ) ගුණධර්මවලින් පිරිපුන් සමාජයක් ගොඩනැඟීමට ආගම දහමින් නොමඳ පිටිවහලක් ලබා දෙයි. යහපත හා අයහපත හඳුනාගෙන එමගින් පුද්ගල චරිතය හැඩගැස්වීමටත් ආගමික ඉගැන්වීම් මූලික පදනමක් සපයයි. ආගමික මූලධර්ම අනුගමනය කිරීමෙන් පුද්ගලයා තුළ ආත්මදමනය ඇති වේ. අපරාධ හා අහිතකර ක්‍රියා සමාජයේ අවම මට්ටමකට පත් වේ. පරාර්ථකාමීබව, කරුණාව, දයාව, ඉවසීම වැනි උසස් ගුණාංග ළමා හදවත් තුළ ඇතිවන්නේ දහම් අධ්‍යාපනයක් ලැබීමෙන් හා එම ඉගැන්වීම් අනුගමනය කිරීමෙන් පමණි.

(ලකුණු 25)

(03) පහත දැක්වෙන පාඨය වචන 65-75 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

ශ්‍රී ලංකාවේ සිනමා කර්මාන්තය 1947 ජනවාරි 21 වන දින 'කඩවුණු පොරොන්දුව' තිරගත වීමත් සමග නිල වශයෙන් ආරම්භ විය. මුල් යුගයේ නිපද වූ චිත්‍රපට බොහොමයක් දකුණු ඉන්දියානු ආභාසය ලැබූ ඒවා වුවද, 1956 දී ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතා නිර්මාණය කළ 'රේඛාව' චිත්‍රපටය ලාංකේය සිනමාවට දේශීය අනන්‍යතාවක් එක් කළ සුවිශේෂී සන්ධිස්ථානයක් විය.

ඉන්පසු 1970 දශකය සිංහල සිනමාවේ ස්වර්ණමය යුගය ලෙස සනිටුහන් කරමින් විවිධ ගණයේ උසස් නිර්මාණ රැසක් ප්‍රේක්ෂකයා වෙත සමීප විය. කෙසේ වෙතත් වර්තමානයේ ශ්‍රී ලාංකේය සිනමාව දැඩි අර්බුදකාරී තත්ත්වයකට මුහුණ දී සිටියි. සිනමාහල් වෙත පැමිණෙන ප්‍රේක්ෂක පිරිස ශීඝ්‍රයෙන් අඩුවීම, නිෂ්පාදන පිරිවැය දරාගත නොහැකි ලෙස ඉහළ යාම සහ විද්‍යුත් මාධ්‍ය හරහා එල්ලවන තරගකාරීත්වය මේ අතර ප්‍රධාන වේ. සිනමාශාලාවල පවතින පහසුකම් අවම වීම සහ ගුණාත්මක නිර්මාණවල හිඟකම ද මෙයට බලපා ඇත. මෙම ගැටලු ජය ගැනීමට නම් සිනමාහල් නවීකරණය වීම, නිෂ්පාදකයන් දිරිමත් කිරීම සඳහා රාජ්‍ය අනුග්‍රහය සහ සහන ලබාදීම අත්‍යවශ්‍ය වේ. එමෙන් ම නවීන තාක්ෂණය භාවිත කරමින් ජාත්‍යන්තර මට්ටමේ නිර්මාණ බිහිකිරීම තුළින් දේශීය සිනමාව යළිත් ප්‍රබෝධවත් කළ හැකි ය.

(ලකුණු 10)

(04) පහත දැක්වෙන පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට උත්තර සපයන්න.

පරිසරය යනු අප අවට පවතින සියලුම සජීවී සහ අජීවී දෑවල එකතුවෙන් සැදුම් ලත් පද්ධතියකි. මානව ක්‍රියාකාරකම් හේතුවෙන් පරිසරයේ පවතින ස්වාභාවික ගුණාංග පිරිහීමට ලක්වීම පරිසර දූෂණය ලෙස සරලව අර්ථ දැක්විය හැකි ය. වර්තමානය වන විට මෙය සමස්ත ලෝකය ම මුහුණ දී සිටින ඉතා බරපතල පාරිසරික ගැටලුවකි. වායු දූෂණය, ජල දූෂණය, පස දූෂණය සහ ශබ්ද දූෂණය මෙහි ප්‍රධාන අංශ ලෙස හඳුනාගත හැකි ය. අධික කාර්මිකීකරණය, වනාන්තර විනාශ කිරීම සහ විෂ වායු පිටවන රථ වාහන භාවිතය නිසා වායුගෝලය දූෂණය වන අතර එය ගෝලීය උණුසුම ඉහළ යාමට සෘජුව ම බලපායි.

එමෙන් ම නාගරික අපද්‍රව්‍ය අවිධිමත් ලෙස බැහැර කිරීම සහ කර්මාන්තශාලාවල රසායනික ද්‍රව්‍ය ජල මූලාශ්‍රවලට මුදාහැරීම මගින් ජලය සහ පස දැඩි ලෙස දූෂණය වේ. මෙහිදී අහිතකර ප්‍රතිඵලයක් ලෙස මිනිසාට පමණක් නොව සතුන්ට ද විවිධ රෝගාබාධ වැළඳෙන අතර ජෛව විවිධත්වය ද දැඩි තර්ජනයකට ලක් වේ. වන විනාශය හේතුවෙන් ස්වාභාවික පරිසර පද්ධතිවල සමතුලිතබව බිඳ වැටී තිබේ. අනාගත පරපුරට ජීවත්වීමට සුදුසු ලෝකයක් ඉතිරි කිරීම සඳහා පරිසරය සුරැකීම අප සැමගේ පරම වගකීමකි. ඒ සඳහා තිරසර සංවර්ධන ක්‍රමවේද අනුගමනය කිරීම සහ ප්ලාස්ටික් භාවිතය අව ම කර අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීම වැනි පරිසර හිතකාමී පුරුදු අප තුළ වර්ධනය කර ගත යුතු ය.

(i) ඉහත ඡේදයට අනුව 'පරිසර දූෂණය' යනු කුමක් ද?
(ii) පරිසර දූෂණය ප්‍රධාන වශයෙන් සිදුවන ආකාර හතර නම් කරන්න.
(iii) වායුගෝලය දූෂණය වන ප්‍රධාන සාධක දෙකක් දක්වන්න.
(iv) පරිසර දූෂණය නිසා ජීවීන්ට සහ පරිසරයට ඇති වන අහිතකර බලපෑම් දෙකක් සඳහන් කරන්න.
(v) පරිසර දූෂණය අවම කර ගැනීම සඳහා අප අනුගමනය කළ යුතු පරිසර හිතකාමී පුරුදු දෙකක් ලියන්න.

(ලකුණු 2 x 5 = 10)

(05) රන්දියපොකුණ ග්‍රාමෝදය සමිතිය මගින් ප්‍රදේශයේ ගායන හැකියාවක් ඇති තරුණ ගායක ගායිකාවන් සඳහා වැඩමුළුවක් සංවිධානය කර ඇත. වැඩමුළුව පැවැත්වෙන දිනය 2026 දෙසැම්බර් මස 20 වන දින වේලාව පෙ.ව. 9.00 සිට ප.ව. 7.00 දක්වා වේ. ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ප්‍රවීණ ගායක කැලුම් දේදුණුආරච්චි මහතා සහභාගි වීමට නියමිත ය. වැඩමුළුව අවසානයේ ගී රසවින්දන වැඩසටහනක් ද පැවැත්වේ. වැඩමුළුව පැවැත්වෙන ස්ථානය වන්නේ රන්දිය පොකුණ යොවුන් රඟහලයි.

පූර්වෝක්ත වැඩමුළුව සඳහා රන්දියපොකුණ යොවුන් රඟහල ලබාදෙන මෙන් ඉල්ලා ප්‍රාදේශීය මහ ලේකම්තුමා වෙත යැවෙන රාජකාරී ලිපිය ලියන්න.
ග්‍රාමෝදය සමිතියේ ලේකම් සුදත් වැලිගෙපොළ ඔබ යැයි සිතන්න. (මේ සඳහා වචන 100ක් පමණ සෑහේ)

නැතහොත්,

අංක 261, සාරගම, පනාවැන්න පිහිටි ගෘහ භාණ්ඩ හා ගෘහ විදුලි උපකරණ අලෙවි (පෞද්ගලික) සමාගමක් වන 'සුපර්-ලංකා' ආයතනය සිය වෙළෙඳ සමාගම් ජාලය පුළුල් කිරීමේ අරමුණින් මේ උත්සව සමයේ පාරිභෝගිකයන්ට සහන රැසක් ලබාදීමට අදහස් කර ඇත.

- භාණ්ඩ මිල්දී ගැනීමේදී වාරික මගින් ගෙවීමේ පහසුකම්
- මිල්දීගන්නා ගෘහ විදුලි උපකරණ සඳහා 15%-20% තෙක් විශේෂ වට්ටම්
- මිල්දීගන්නා ගෘහ භාණ්ඩ සඳහා 25%ක විශේෂ වට්ටම්
- ගෘහ භාණ්ඩ හා ගෘහ විදුලි උපකරණවලට වසර දෙකක වගකීමක්
- අලෙවියෙන් පසු සේවාව

මේ කරුණු ඇතුළත් කරමින් බෙදා හැරීමට සුදුසු ආකර්ෂණීය අත්පත්‍රිකාවක් සකස් කරන්න.

(ලකුණු 15)

සියලු හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

57341

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2026
Year End Evaluation

ශ්‍රේණිය தரம் Grade	10	විෂයය பாடம் Subject	සිංහල භාෂාව හා සාහිත්‍යය	පත්‍රය வினாத்தாள் Paper	III	කාලය காலம் Time	පැය 02

උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර ලියන්න

- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත මුළු ලකුණු ගණන 80කි.

---

(01) **(i) සිට (x) තෙක් ඇති සියලුම අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න.**
කිසියම් කොටසකට උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) "කියව ආචාරීනි, තොප කීවාක් කෙරෙමි."
- අ. මෙම ප්‍රකාශය ශ්‍රවණය කරන ලද්දේ කවුරුන් විසින් ද?
- ආ. මෙම ප්‍රකාශය කළේ කවර ස්ථානයකදී ද?

(ii)
- අ. ගුත්තිල කාව්‍යය රචනා කළේ කුමන සාහිත්‍ය යුගයේදී ද?
- ආ. ගුත්තිල කාව්‍යය රචනයට ආරාධනා කළේ කවුරුන් ද?

(iii)
- අ. එස්. මහින්ද හිමියන් ලියූ මුල්ම කාව්‍ය කෘතිය නම් කරන්න
- ආ. උන්වහන්සේ සිය කාව්‍ය නිර්මාණ සඳහා යොදාගත් කාව්‍ය තේමා දෙකක් ලියන්න.

(iv)
- අ. සිංහබාහු නාට්‍යයට පදනම් වූ තේමාත්මක කතා පුවත උපුටාගත් කෘතිය කුමක් ද?
- ආ. මෙම නාට්‍ය රචකයාගේ වෙනත් නාට්‍ය නිර්මාණ දෙකක් නම් කරන්න.

(v)
- අ. එච්.එම්. කුඩලිගම කවියා 'සිංහල ෂෙලී' ලෙසින් හැඳින්වූයේ ඇයි?
- ආ. කුඩලිගම කවියා ලියූ ජනප්‍රිය පද්‍ය ග්‍රන්ථය නම් කරන්න.

(vi)
- අ. පහත පද්‍යයේ ඉතිරි පාද දෙක සම්පූර්ණ කරන්න.

කරදර දහසක් හමු	වී
ඉන්ටැකි නම් සිනා	වෙවී

- ආ. කරදර හමුවේ නොසැලෙන පුද්ගලයා කවරකු ලෙස කවියා දකින්නේ ද?

(vii) "මට මෙහි පමාවක් නැත්තෙමි. තෙපි උකටලී නොව නොපමාව වසව"
- අ. මෙහි 'තෙපි' යනුවෙන් අමතන්නේ කා හටද?
- ආ. පමාවක් නැත්තේ කුමක් සඳහා ද?

(viii)
- අ. 'හානාහීය පානා අඩහැරෙන් දැනේ' පද්‍ය පන්තිය අයත් වන ජන කවි වර්ගය කුමක් ද?
- ආ. ජන කවිය හා බැඳුණු වෘත්තීන් දෙකක් නම් කරන්න.

(ix) "කොටියගේ පැටියා මුවෙක් වෙලා"
අ. මේ ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?
ආ. 'මුවෙක්' යනුවෙන් අදහස් කළේ කවුරුන් පිළිබඳව ද?

(x) "කිමිද මැණියනි, ඔබ මේ පවසන වදනා
ඇස් කන් ඇදහිය නොහේ ය ඇසෙන මේ අරුමා"
අ. මේ ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?
ආ. 'ඇසෙන මේ අරුමා' යනුවෙන් අදහස් වන්නේ කුමක් ද? (ලකුණු 2 × 10 = 20)

(02) පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) "කොල, එහා මේ නුවර ඒ ඒ දිගින් අගල මැඩ හස්වා පවුරු, දොරටු, අටලු, වාසල්, බලකොටු ආදිය බිඳ, සුනු විසුනු කෙරෙමින් එහා නුවරට වැද, ගැල් පුරා ගෙනවුත් කොමඩු බානා සේ මහා ජනයා හිස් කපා ගනුව, වේදේහ රජහු හිසත් එහා ගෙනව."

අ. ඉරි ඇදි පද දෙකෙහි අර්ථ ලියන්න.
ආ. මෙහි සඳහන් උපමාව හා උපමේය ලියන්න.

(ii) පහත පද්‍යයේ ඉතිරි පාද දෙක ලියන්න.
අ. "පියසන් නොව බිඟු දැල් රැඳි කොපුලී
අවසන් නොව වෙණ නදටම කුහුලී"

ආ. ඉහත පද්‍යයෙන් කියැවෙන පරිදි වීණා නාදය අසන ඇතුන් සිටියේ කෙසේ ද?

(iii) "සියලු භෝග වස්තු ඉසුරු - හරිති නෙක් දනෝ
සව් සැප දෙන සිතුමිණ වන් - ප්‍රේමය සන්දා"

අ. ඉරි ඇදි පද දෙකෙහි අර්ථ ලියන්න.
ආ. මෙම ප්‍රකාශය සිදු කරන ලද්දේ කා විසින් ද?

(iv) "ගං ඉවුරෙ අලි ඇට නරි අදිනවා කියලා අනික් අලි ගඟේ නාන්නේ නැතුව අරිනවා ද?"

අ. ඉහත ප්‍රකාශය කළේ කවුරුන්ද?
ආ. මෙයින් කියැවෙන ව්‍යංගාර්ථය කුමක් ද?

(v) "පැහැවෙමි එබෙමි නිසසල වෙමි සසල වෙමි
ඇඹරෙමි එහෙත් පසු නොබසිමි නොනවතිමි
කවදා කොතැනකදි හෝ මහ මුහුදු හිමි
හමුවුණු කෙනෙහි මා සතු බර ඔහුට දෙමි"

අ. මෙහි ඇතුළත් කාව්‍යාලංකාරය කුමක් ද?
ආ. මෙම පද්‍යය ලියා ඇති දෘෂ්ටිකෝණය කුමක් ද? (ලකුණු 4 × 5 = 20)

(03) (i) සිංහබාහු නාට්‍යයේ,
අ. තම රාජ්‍ය උරුමය කෙරෙහි නොඅඩු ආශාවෙන් පසු වන පුතෙකුගේ ක්‍රියාකාරිත්වය සිංහබාහු චරිතයෙන් ද
ආ. පිය සෙනෙහසට අවනත දුවකගේ අවිහිංසක සිතුවිලි සිංහ සීවලී චරිතයෙන් ද මැනවින් විදහා දැක්වේ. 'ලෙන අතහැර යාම' පාඩම ඇසුරෙන් එක් කරුණකට උදාහරණ දෙක බැගින් ගෙන මේ පිළිබඳ විමසීමක් කරන්න.
නැතහොත්,

(ii) අ. වනගත පරිසරයේ පීඩාවට හසුවන ගැමියන්ගේ දුක්බර ජීවන තත්ත්වයත්
ආ. කුටෝපක්‍රමවලට හසු වී විනාශ වන ජන ජීවිතයත්
පිළිබඳවත් බැද්දේගම කතුවරයා මැනවින් විදහා පායි. එක් කරුණකට උදාහරණ දෙක බැගින් ගෙන මෙම කියමන සනාථ කරන්න. (ලකුණු 15)

Past Papers Wiki

(04) (i) වේදේහ රජුට සේවය කරන මහෞෂධ පඬිතුමා,

අ. සතුරු කුමන්ත්‍රණ පරදා රාජ්‍යය බේරාගන්නා ආකාරයත්

ආ. කිසිදු ජීවිත හානියක් සිදු නොවන්නට වග බලා ගන්නා ආකාරයත්

අපූර්ව ආකාරයෙන් ඉදිරිපත් කිරීමට ජාතක කතාකරු සමත් විය. එක් කරුණකට උදාහරණ දෙක බැගින් ගෙන මේ පිළිබඳ පැහැදිලි කරන්න.

නැතහොත්,

(ii) ගුත්තිල කාව්‍යයේ කතුවර හිමියන්,

අ. වර්ණනයට උචිත පරිදි කාව්‍ය විරිත් වෙනස් කිරීමත්

ආ. අර්ථාලංකාර භාවිතයත්

මගින් ස්වකීය නිර්මාණය රසගැන්වීමට සමත් වී ඇත.

එක් කරුණකට නිදසුන් දෙක බැගින් දෙමින් විමසන්න.

(ලකුණු 15)

(05). කවියා තම අභිමතාර්ථ සාධනය සඳහා විවිධ කාව්‍යෝපක්‍රම භාවිත කළ ආකාරය 'ගංගාවේ සංගීතය' පද්‍ය පන්තිය ඇසුරින් උදාහරණ තුනක් සමගින් විමසන්න.

(ලකුණු 10)

(06) 'මුනි සිරිපා සිඹිමින්නේ' නිර්මාණයෙන් එස්. මහින්ද හිමියන් පුද්ගල චරිත සංවර්ධනයට අනුපමේය දායකත්වයක් ලබා දී ඇත. උදාහරණ තුනක් සමගින් සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

(07) 'හානා හීය පානා අඬ හැරෙන් දැනේ' පද්‍ය පන්තියෙන් අපට ලබා දී ඇති උපදෙස් සර්වකාලීන ය. උදාහරණ තුනක් සමගින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

PAST PAPERS WIKI

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
මේල් මාකාණක් කල්විත් තිණෙක්කළම්
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2026
Year End Evaluation

ශ්‍රේණිය தரம் Grade	10	විෂයය பாடம் Subject	සිංහල භාෂාව හා සාහිත්‍යය	පත්‍රය வினாத்தாள் Paper	කාලය காலம் Time	පැය 02

උත්තර පත්‍රය

I කොටස

(1)	2	(11)	3	(21)	2	(31)	2
(2)	1	(12)	1	(22)	3	(32)	3
(3)	3	(13)	4	(23)	4	(33)	1
(4)	3	(14)	3	(24)	2	(34)	4
(5)	4	(15)	1	(25)	3	(35)	2
(6)	1	(16)	1	(26)	2	(36)	2
(7)	2	(17)	2	(27)	2	(37)	3
(8)	3	(18)	3	(28)	1	(38)	2
(9)	2	(19)	2	(29)	3	(39)	4
(10)	4	(20)	4	(30)	4	(40)	4

(ලකුණු 1 x 40 = 40යි)

II කොටස

• ආදර්ශ උත්තර හා ලකුණු දීමේ පටිපාටිය

(01) (i) (අ) මනඃකල්පිත/අන්තඃඛණ්ඩය/දුඃඛිත/වයඃකල්‍යාණ/පුරඃසර ආදි නිවැරදි වචනයක් ලියා ඇත්නම් ලකුණු දෙන්න.

(ආ) උ, උෟ, ප, ඒ, බ, භ, ම, ඹ, ව, ෆ යන අක්ෂර අතුරින් එකක් ලියා ඇත්නම් ලකුණු දෙන්න.

(ii) (අ) ලේඛන (ආ) ප්‍රකාශන

(iii) (අ) ප්‍රයෝජ්‍ය ක්‍රියා (ආ) අනියමාර්ථ අසම්භාව්‍ය ක්‍රියා

(iv) (අ) අවනතිය (ආ) ප්‍රසාරණය

(v) (අ) පූර්ව රූප සන්ධිය/බාහිර සන්ධිය (ආ) ද්විත්ව රූප සන්ධිය/අභ්‍යන්තර සන්ධිය

(vi) (අ) කපා දැමූ කුඩා ගොයම් කැටි (ආ) හුළං පෙති

(vii) (අ) තක්සේරුව (ආ) අත්තනෝමතික

(viii) (අ) ඔහු (ආ) කවුරුන්

(ix) (අ) අනු (ආ) සම්

(x) (අ) සිංහලයන් අවදි කිරීමට අනගාරික ධර්මපාල උතුමාණන් අප්‍රතිහත ධෛර්යයෙන් කටයුතු කර ඇත.

(ආ) අප විසින් මහ මෙත් මහ තෙරණුවෝ සැමරුණු

(ලකුණු 2 x 10 = 20යි)

(02) (1) සාරවත් භාවය, මාතෘකාව ද ඇතුළුව - ල. 08

(2) සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ල. 12

(3) ශිල්පීය දක්ෂතා හා ඡේද බෙදීම - ල. 05

මුළු ලකුණු - 25

(1) සාරවත්භාවය -

විස්තරයට අදාළ වන පරිදි මාතෘකාව - ල. 01

තේමාවට අදාළ බව, ඉදිරිපත් කොට ඇති ව්‍යුහයට සමීපබව, සරුබව, වචන ගණන 250ට සමීපව පැවතීම, කරුණුවල සාරවත්භාවය යටතේ සැලකිල්ලට ගත යුතු වේ.

(2) සංවිධානය, නිර්මාණාත්මක භාවය හා ස්වීයත්වය

මෙහිදී උසස් ප්‍රකාශන ශක්තිය සංවිධානය, ස්වීයත්වය, නිර්මාණාත්මක ප්‍රකාශනය, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය ආදි අංග පිළිබඳ සලකා බලන්න.

(3) ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම

වියරණ, අත්අකුරු, විරාම ලක්ෂණ භාවිතය, ඡේද අදාළ පරිදි බෙදා තිබීම, වචන වෙන් කර ලිවීම යන අංග ගැන සලකා ලකුණු තීරණය කරන්න.

(03)

- 1947 'කඩවුණු පොරොන්දුව' චිත්‍රපටයෙන් ලාංකේය සිනමාව ආරම්භ විය.
- 'රේඛාව' චිත්‍රපටය දේශීය සිනමා අනන්‍යතාව ගොඩ නැගූ ප්‍රධාන සන්ධිස්ථානයකි.
- 70 දශකයේ ස්වර්ණමය යුගයෙන් පසු වර්තමානයේ ප්‍රේක්ෂක ආකර්ෂණය ගිලිහී ගොස් ඇත.
- ඉහළ නිෂ්පාදන පිරිවැය හා තාක්ෂණික දුර්වලතා වත්මන් ක්ෂේත්‍රයේ ප්‍රධාන ගැටලු වේ.
- සිනමාහල් නවීකරණය හා රජයේ සහන ලබාදීම කර්මාන්තය නැංවීමට අත්‍යවශ්‍ය වේ.
- තාක්ෂණික හා ගුණාත්මක අංශ වැඩිදියුණු කිරීමෙන් සිනමාව යළිත් ප්‍රබෝධවත් කළ හැකිය.

(1) අන්තර්ගතය - 06

(2) වචන ගණන - 02

(3) ශිල්පීය දක්ෂතා - 02

මුළු ලකුණු - 10

- වචන 75 ඉක්මවන කල්හි මුල් වචන 75 පමණක් ඇගයීමට ලක් කරන්න.
- වචන 65ට අඩු කල්හි එහි ඇතුළත් අදහස් පමණක් සලකන්න.
- ඡේද බෙදා තිබුණොත් ශිල්පීය දක්ෂතා කොටසින් ලකුණු අඩු කරන්න.
- එක යට එක අසම්බන්ධිතව ලියා ඇති කල්හි ලකුණු 02ක් පමණක් දෙන්න.
- වචන ගණන 75ට වැඩිකල්හි හෝ 65ට අඩු කල්හි ලකුණක් අඩු කරන්න.
- දුර්වල සාරාංශයකට 0 නොදී ලකුණු 03ක් (මුළු ලකුණු) දෙන්න.

(04) (i) මානව ක්‍රියාකාරකම් හේතුවෙන් පරිසරයේ පවතින ස්වාභාවික ගුණාංග පිරිහීමට ලක්වීම පරිසර දූෂණය ලෙස කිව හැක.

(ii) වායු දූෂණය / ජල දූෂණය / පස දූෂණය / ශබ්ද දූෂණය (උත්තර හතරම ඇති නම් ලකුණු 02ක් දෙන්න. එකක් හෝ අඩු නම් ල. 01)

(iii) අධික කාර්මිකීකරණය / වනාන්තර විනාශ කිරීම / විෂවායු පිටවන රථවාහන භාවිතය (යන තුනෙන් ඕනෑම උත්තර 2ක් ගත හැකි ය.)

(iv) විවිධ රෝගාබාධ ඇති වීම / ජෛව විවිධත්වය දැඩි තර්ජනයට ලක් වීම

(v) තිරසර සංවර්ධන ක්‍රම අනුගමනය කිරීම / ප්ලාස්ටික් භාවිතය අවම කර අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීම.

(ලකුණු 02 x 5 = 10 යි)

(05) • <u>රාජකාරී ලිපිය</u>

1. ආකෘතිය සඳහා ලකුණු 04
2. අන්තර්ගතය සඳහා ලකුණු 08
3. ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු 03

මුළු ලකුණු - 15

(1) ආකෘතිය - ලකුණු 04

1. යවන්නාගේ නම සහ ලිපිනය/දිනය - ල. 01
2. ලබන්නාගේ තනතුර හා ලිපිනය - ල. 01
3. මාතෘකාව - ල. 01
4. අත්සන හා දිනය - ල. 01

} ල. 04

(2) අන්තර්ගතය - ලකුණු 08

අන්තර්ගතය විය යුතු ප්‍රධාන කරුණු

1. වැඩමුළුවක් සංවිධානය කිරීම - ල. 01
2. වැඩමුළුව පැවැත්වෙන දිනය - ල. 01
3. ස්ථානය - ල. 01
4. වේලාව - ල. 01
5. ප්‍රධාන ආරාධිත අමුත්තා - ල. 01
6. වැඩමුළුව සංවිධානය වන්නේ කා හටද යන්න - ල. 01
7. ගී රස වින්දන වැඩසටහනක් පැවැත්වෙන බව - ල. 01
8. රඟහල ලබාදෙන ලෙස ඉල්ලීම - 01

} ල. 08

(3) ශිල්පීය දක්ෂතා - ලකුණු 03

1. නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු නිවැරදි පද බේදීම, විරාම ලක්ෂණ සමස්තයක් සේ සලකා ලකුණු පිරිනමන්න.
2. නියමිත වචන ගණන අඩුවන කල්හි ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි අනුපාතික ලකුණක් දෙන්න.
3. නියමිත ආකෘතිය නොමැති කල්හි අන්තර්ගතය සඳහා දිය හැකි උපරිම ලකුණු ගණන 03කි.

• <u>අත්පත්‍රිකාව</u>

1. ආකෘතිය සඳහා ලකුණු 04
2. අන්තර්ගතය සඳහා ලකුණු 08
3. ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු 03

මුළු ලකුණු - 15

(1) ආකෘතිය සඳහා - ලකුණු 04

1. මාතෘකාව (ආකර්ෂණීය විය යුතුයි) - ල. 01
2. පළකරන්නාගේ නම / ආයතනය - ල. 01
3. නිර්මාණශීලීත්වය (අකුරුවල හැඩතල / ප්‍රමාණය / වර්ණ ගැන්වීම ආදිය) - ල. 02

} ල. 04

(2) අන්තර්ගතය - ලකුණු 08

1. පිහිටි ස්ථානය / ප්‍රදේශය - 01
2. ගෘහ භාණ්ඩ හා ගෘහ විදුලි උපකරණ ගෙන්වා බෙදා හරින සමාගමක් බව (පුද්ගලික) - 01
3. අරමුණ 'වෙළෙඳ ජාලය පුළුල් කිරීම බව - 01
4. ගෘහ භාණ්ඩ මිලදී ගැනීමේ දී වාරික මගින් ගෙවීමේ පහසුකම් (25% විශේෂ වට්ටම්) - 01
5. ගෘහ විදුලි උපකරණ මිලදී ගැනීමේදී 15% - 20% - 01
6. සියලුම භාණ්ඩ සඳහා වසර 02ක වගකීම - 01
7. අලෙවියෙන් පසු සේවාව - 01
8. තමාට අවශ්‍ය භාණ්ඩ නිවසටම ගෙන්වා ගැනීමේ හැකියාව - 01

} ල. 08

(3) ශිල්පීය දක්ෂතා - ලකුණු 03

1. නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු නිවැරදි පද බේදීම, විරාම ලක්ෂණ සමස්තයක් සේ සලකා ලකුණු පිරිනමන්න.
2. නියමිත වචන ගණන අඩුවන කල්හි ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි අනුපාතික ලකුණක් දෙන්න.
3. නියමිත ආකෘතිය නොමැති කල්හි අන්තර්ගතය සඳහා දිය හැකි උපරිම ලකුණු ගණන 03කි.

III කොටස

(01) (i) අ. කේවට්ට බමුණා / කේවට්ටාචාරීන් / බ්‍රහ්මදත්ත රජුගේ පුරෝහිත බමුණා වූ කේවට්ටාචාරීන්
ආ. මඟුල් උයනේ මඟුල් සල්වටෙහි / මඟුල් උයනේ මඟුල් සල් ගස යටදී

(ii) අ. කෝට්ටේ සාහිත්‍ය යුගයේදී
ආ. පැරකුම්බා රජුගේ අගමැති සලාවත ජයපාල මැතිඳුන් / සලාවත ජයපාල මැතිඳුන්

(iii) අ. ඔවා මුතු
ආ. ළමා කවි / දේශානුරාගී කාව්‍ය / බුද්ධාභිවන්දනා කාව්‍ය

(iv) අ. මහා වංශය
ආ. මනමේ /පේමතෝ ජායතී සෝකෝ / පබාවතී / එලොව ගිහින් මෙලොව ආවා

(v) අ. ස්වභාව සෞන්දර්යය හා බැඳුණු කවි ආරෙන් කාව්‍ය රචනා කළ බැවින්
ආ. 'ඈ'

(vi) අ. ඔහු මෙලොවට පහළ දෙවී - රජෙකැයි සලකනු මැනවී
ආ. මෙලොවට පහළ වූ දෙව් රජෙකු ලෙස

(vii) අ. බෝධිසත්ත්වයන් විසින් බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් සමීපයේ සිටුවන ලද පුරුෂයන් හට /යෝධයන්ට
ආ. චූලනී බ්‍රහ්මදත්ත රජු ඇතුළු පිරිස දඹදිව රාජ්‍ය අල්ලා ගැනීම පිළිබඳ නිසි තොරතුරු දැන ගැනීම පිළිබඳ

(viii) අ. දැනමුතුකමට කී කවි / උපදේශාත්මක කවි
ආ. පතල් කර්මාන්තය, පාරු පැදීම, බඹර කැඩීම, ගැල් පැදවීම

PAST PAPERS WIKI

Past Papers Wiki

(ix) අ. බැද්දේගම ගම් වැසියන්
ආ. පුංචි මැණිකා ගැන / බබුන්ගේ බිරිඳ ගැන

(x) අ. සිංහබාහු විසින්
ආ. සුප්පා දේවිය වංග දේශයේ රජුගේ දියණිය බව / සිය මෑණියන් රජ කුමරියක බව

(ල. 2 x 10 = 20)

(02) (i) අ. මැඬ හස්වා - යටපත් කර / ගොඩ කර / තුරන් කර (මෙහිදී අගල පස්, ගල් වැනි දේ යොදා ගොඩ කර යන්න අර්ථවත් වේ)
අටලු - අට්ටාල / රාජධානිවල ආරක්ෂිත පවුරු ආශ්‍රිතව මුරකිරීමට තනන කුඩා කුටි
ආ. උපමාව - ගැල් පුරා ගෙනවුත් කොමඩු බානා සේ
උපමේය - මහජනයා හිස් කපා ගනුව

(ii) අ. මද සන්සුන් පියොවින් සිටි නොසැලී
ගජසෙන් සිතියම් ගජ සිරි කියෙලී
ආ. අඳින ලද සිතුවම් මෙන්

(iii) අ. නෙක් - නොයෙක්, සිතුමිණ - චූඩා මාණික්‍යය
ආ. සුප්පා දේවිය විසින්

(iv) අ. පුංචිරාල වෙදරාළ
ආ. ගමේ ඉන්න කවුරුන් හෝ පුංචි මැණිකාට කසාද බැඳගන්නා ලෙස ව්‍යංග්‍යයෙන් කීම.

(v) අ. අනුප්‍රාස රසය / අනුප්‍රාසය / ශබ්දාලංකාරයක්
ආ. උත්තම පුරුෂ දෘෂ්ටි කෝණය (ල. 4 x 5 = 20)

(03) (i) අ. • ''මට ද හිමි වේ වංග රාජ්‍යය ප්‍රබල නරවර පරපුරෙන්''
• ''යන්ට දැන් නම් කාලෙ වේ...උරුමෙ අපගේ සොයමිනා...''
• ''කුමක් දෝ මෙ පාපේ ලෙනේ මේ විසීමේ සෙතක් දෝ''
යනාදී උචිත උදාහරණ දෙකක් ගෙන විස්තර කර තිබීම.

ආ. • ''මා පියා හැර දමා යන්නෙ අප කෙලෙස දෝ''
• ''...නැත කෙනෙක් අහර පිස දෙන්නටා''
• '' නැද්ද වෙත පියාණන් ආදරේ ඔබ හදේ''
යනාදී උචිත උදාහරණ දෙකක් ගෙන විස්තර කර තිබීම.

නැතහොත්

(ii) අ. • වනයෙන් ගම ආක්‍රමණය කිරීම පිළිබඳ
• කර්ලිනා හාමිගේ ශරීරය වැහැරීම පිළිබඳ
• ලෙඩ දුක්වලට හා රෝග පීඩාවලට ගොදුරු වීම පිළිබඳ
යනාදී උචිත උදාහරණ දෙකක් ගෙන විස්තර කර තිබීම.

ආ. • ආරච්චිගේ ගේ බින්ද බවට බොරු නඩුවක් පටලවා බබුන් සිරගත කරවීම.
• පුංචිරාල පුංචි මැණිකාව විවාහයට පොලඹවා ගැනීමට උත්සාහ කිරීම.
යනාදී උචිත උදාහරණ දෙකක් ගෙන විස්තර කර තිබීම. (ලකුණු 15)

(04) (i) (අ)
• දර, පැන්, ජලය නැවැත්වීම ව්‍යර්ථ කිරීම.
• චර පුරුෂ සේවාව

(ආ)

- ජයපානෝත්සවයේදී එක් සියයක් රජවරුන් මරන්නට කළ සැලැස්ම කල්තියා දැන උපායශීලීව එය ව්‍යර්ථ කිරීම.
- ධර්ම යුද්ධය මගින් කේවට්ට බමුණාව මැණිකකින් වංචා කොට සේනාව පලවා හැර මහා ජීවිත හානියක් වැළැක්වීම.

යනාදී උචිත උදාහරණ දෙකක් ගෙන විස්තර කර තිබීම.

නැතහොත්

(ii) (අ) • ඒ ඒ වර්ණනයට උචිත පරිදි,
මහ පියුම් විරිත / ගී විරිත, පෙද විරිත, සවිසිමත් විරිත භාවිත කර ඇති ආකාරයට උදාහරණ දෙකක් සහිතව විස්තර කර තිබීම.

(ආ) • පද කමල, සුර ගඳඹුන් ලෙසට, සුරසුන් පැනවූ වැනි, සිතිවිලි නැති රූ විලස, සුර විලසී, දිමුතු යසස් වන්, රූ රැසේ අඳිනා ලෙසේ, රන් රසේ එක් වන ලෙසේ, කම් පසේ දෙන සැර ලෙසේ යනාදි රූපකාලංකාර හා උපමාලංකාර ද ස්වභාවෝක්ති, අතිශයෝක්ති අලංකාරය වැනි උචිත ඕනෑම අර්ථාලංකාරයක් / අර්ථාලංකාර කිහිපයක් සඳහා උදාහරණ දෙකක් ගෙන විස්තර කර තිබීම.

(ලකුණු 15)

(05) • උත්තම පුරුෂ දෘෂ්ටි කෝණය භාවිත කරමින් ගංගාවට සජීවී බවක් ආරෝපණය කිරීම.
- 'හිරිමල් සිනා රැළි පෙණ පිඬු', 'මහ මුහුදු හිමි' යනාදී රූපක භාවිත කිරීම.
- එළිසමය සහිත සිවු පද ආකෘතියට අයත් සමුද්‍ර ඝෝෂ විරිත භාවිත කරමින් ශබ්ද රසයක් ජනනය කිරීම.

යනාදී උචිත උදාහරණ තුනක් ගෙන විස්තර කර තිබීම. (ලකුණු 10)

(06) • කුඩා අවධියේ සිට ම තම ආගම කෙරෙහි ගෞරවයක් ජනනය කිරීමට උත්සහ කිරීම.
('මුනි සිරිපා', 'ආගම මිණි පහනක්', 'දිවි පෙවෙතේ කොටසක් සමය වෙතේ')
- තමා උපන් රටෙහි නිදහස දිනා දිය හැක්කේ එරට මිනිසුන්ට ම වන බව දරුවාට ඒත්තු ගැන්වීම මගින් දරුවෙකුගේ චරිත සංවර්ධනයට රුකුල් දීම.
('නිදහස මහ මුහුදක් වේ - එහි උල්පත පුත නුඹ වේ', 'යුතුකම ඉටුකළ යුතු වේ', 'දිවි පෙවෙතේ කොටසක් රට වෙතේ')
- සමානාත්මතාව, සහජීවනය, ඉවසීම යනාදි පුද්ගල චරිත සංවර්ධනයට අත්‍යවශ්‍ය උතුම් මනුෂ්‍ය ගුණධර්ම පිළිබඳ දරුවාට ඉගැන්වීමට උත්සාහ කිරීම.
('ලැබුණත් ලෝකෙන් ගැරහුම් - ඉවසන්නට පුළුවන් නම්', 'කරදර දහසක් හමු වී - ඉන්ටැකි නම් සිනා වෙවී', 'සිනිඳු මොළොක් බව මලෙහි - එක් වී මා පුතුගෙ ළෙහි', 'දූවිල්ලක් එක්ක වුණත් - මිතුරු වෙයන් පුතේ උඹත්')

යනාදී උචිත උදාහරණ තුනක් ගෙන විස්තර කර තිබීම. (ලකුණු 10)

(07) • තම තරම දැන කටයුතු කළ යුතු බව.
- යමක් කළ යුත්තේ එය කළ යුතු නිසි කලට වේලාවට ය. එය සාර්ථක වන්නේත් ඵලදායී වන්නේත් එවිට ය.
- විවාහ ජීවිතයේදී මනා අවබෝධයෙන් කටයුතු කළ යුතු බව.
- කා අතිනුත් වැරදි සිදු විය හැකි බව දැන අනුන් අතින් සිදු වන වැරදි අනවශ්‍ය ලෙස උලුප්පා දැක්වීමට උත්සාහ නොකළ යුතු බව.
- අතිශය මිත්‍රත්වයෙන් යුතු අය අතර වුවද නොගැළපීම් ඇති විය හැකි බව සහ සමාජයේ කුමන තරාතිරමක අයට වුවද දුක සැප උරුම බව

යනාදී උචිත උදාහරණ තුනක් ගෙන විස්තර කර තිබීම. (ලකුණු 10)

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library